# 27

# අසල් වැසියන් සමඟ යහපත් සම්බන්ධතාවයක් පවත්වා ගනිමු

අප ජීවත්වන නගරයේ හෝ ගමේ ජනපද රාශියක් දක්නට ලැබෙනවා. එවායේ විවිධ ජාතීන්ට අයත් ජනතාව ජීවත් වෙනවා. අපේ ගෙදරට ඉදිරියෙන් හා පසුපසින් ද දකුණු පැත්තෙන් හා වම් පැත්තෙන් ද ගෙවල් රාශියක් දක්නට ලැබෙනවා. සමහර ගෙවල් ළඟින් ද, තවත් සමහරක් ඈතින් ද පිහිටනවා. මෙම ගෙවල්වල පදිංචි සෑම කෙනෙකු ම අනික් කෙනෙකුට අසල්වැසියෙක් වෙනවා. අසල්වැසියන්ව අල්ලපු ගෙදර අය ළඟ පාත අය කියා විවිධ නම්වලිනුත් හඳුන්වනවා.

හදිසි අනතුරක් හෝ අවශ්‍යතාවක් ඇති වුණාම මුලින් ම උදව්වට එන්නේ අපේ අසල්වැසි අයයි. දුර ඉන්න නෑදෑයින් යහළුවන් ආදීන්ට වහාම උදව්වට එන්න බැරිය. ඔවුන් පමා වී පැමිණෙති. එම නිසා අසල් වාසීන් සමඟ අප හොඳ හිත වත්කමක් පවත්වා ගත යුතු ය. සුළු කරුණු විශාල නො කළ යුතු අතර ඒ ගැන අමනාප නොවිය යුතුයි. අඬ දබර කර ගැනීමෙන් හෝ ආරවුල් ඇති කර ගැනීමෙන් හෝ වැළකිය යුතුය. සමහර කරුණු වලට සමා වී අමතක කර දැමිය යුතු ය. ඒ අය සමඟ සහයෝගයෙන් ජීවත් විය යුතු අතර මුඃමින්වරුන්ගේ ශිෂ්ටත්වය වන්නේ එයයි.

අසල් වැසියෝ තුන් ආකාරයක් වෙති එනම්

1. ඥාතීන් වන අසල් වාසීන්.

2. මුස්ලිම්වන අසල් වාසීන්.

3. මුස්ලිම් නොවන අසල්වාසීන්.

ඒ සියලු ආකාරයේ අය සමඟ ම අප සහයෝගයෙන් ජීවත් විය යුතු ය. ඔවුන්ගෙන්




කිසිවෙකු හෝ කොන් කිරීමෙන් වැළකී සිටිය යුතු ය.

විනීතව හැසිරිය යුතු ය. මක් නිසා ද යත් තම අසල්වාසින් සමඟ යහපත් ඇසුරක් පවත්වන අය අල්ලාහ් විසින් යහපත් අසල් වාසීන් වශයෙන් සලකනු ලබන බව නබි (සල්) තුමා පවසා තිබෙනවා. (තිර්මිදි)

නිවැසියකු ගැන දැන ගැනීමට ඔහුගේ අසල් වාසීන්ගෙන් ඔහු ගැන අසා බැලිම පුරුද්දකි. මක් නිසා ද යත් කෙනෙකු ගැන හොඳාකාරව දන්නේ ඔහුගේ අසල් වැසියන් ය. අයකු ගැන ඔහුගේ අසල් වැසියන් කියන සාක්කි පිළිගත හැකි ආකාරයේ එකක් වනවා. අසල් වාසින් සමඟ යහපත් සම්බන්ධතාවක් පවත්වා ගන්නා කෙනකු බොහෝ විට හොඳ කෙනෙකු වෙනවා.

වරක්, "අල්ලාහ් මත දිවුරා කියමි ඔහු මුඃමින් නොවේ. අල්ලාහ් මත දිවුරා කියමි ඔහු මුඃමින් නොවේ. අල්ලාහ් මත දිවුරා කියමි ඔහු මුඃමින් නොවේ." යැයි නබි (සල්) තුමාණෝ කීහ. නබි (සල්) තුමාගෙන් "ඔහු කවුදැයි" අසනු ලැබුවා. එවිට "කවරකුගේ හිංසා පීඩාව ගැන අසල් වාසින් බිය වෙනවා ද ඔහුය ඒ පුද්ගලයා" කියා නබි (සල්) තුමා දිවුරා කීවේය. (බුහාරි, මුස්ලිම්)

අහළ පහළ ජීවත් වන අයට අසාධාරණයක් කිරීම බරපතල වරදක් ලෙස ඉස්ලාම් සලකනවා. ඔවුන්ගේ අයිතිවාසිකම් හා යුතුකම් ගැන, බලවත් ලෙස අවධාරණය කරනවා. ජිබ්රීල් (අලයි) තුමා නිතර නිතර අසල්වැසියන් ගැන නබි (සල්) තුමාට අවවාද කළා. අසල් වාසීන් උරුමක්කාරයන් බවට පත් කරත් දෝයි සිතන තරමට අසල් වාසීන්ගේ අයිති වාසිකම් ගැන කියනු ලැබූ බව නබි (සල්) තුමා පැවසුවා.

එම නිසා අහළ පහළ සිටින්නන් සමඟ අප ඉතා විනීත ව ඇසුරු කරන්න ඕනෑ. ඔවුනට සලාම් කිව යුතු ය. උදව් අවශ්‍ය වන අවස්ථා වල උදව් කළ යුතුයි. ණය ඉල්ලූ අවස්ථාවක හැකි පමණින් ණය ලබා දී උදව් කළ යුතුයි. ඔවුනට හොඳ යමක් සිදු වූ විට ඔවුනට සුබ පැතිය යුතු ය. ඔවුන්ට ඛේදවාචකයක් ඇති වූ විට සැනසිලි බස් කිව යුතු ය. රෝගී වූ විට සුව දුක් විමසිය යුතු ය. අවමංගල අවස්ථාවේ දී ජනාසාවට යා යුතු ය. තෑගි බෝග හුවමාරු කර ගත යුතුයි.

සමගිය බලය වේ. බෙදී වෙන් වී සිටීම දුර්වලකම වන්නේ ය. එනිසා අසල් වැසියන් සමඟ සාමකාමී ව ජීවත් විය යුතු ය. ඔවුන් පිළිකුල් නොකළ යුතු ය. ඔවුන් සමග ඕනෑවට එපාවට ඇසුරු නොකළ යුතු ය. ඒ අයගේ අඩුපාඩුකම් සෙවීම නොකළ යුතු ය. ඔවුන්ගේ ඕපාදූප කතා කිරීමත්, ඔවුන් ගැන කේලාම් කීමත් නොකළ යුතු ය. ඊර්ෂ්‍යා නොකළ යුතු ය. ඔච්චම් කිරීම හෝ සරදම් කිරී මෙන් වැළකී සිටිය යුතු ය. අපහාස නොකළ යුතු ය. මෙවැනි ක්‍රියා නිසා අසල් වැසියන් අතර ඇති නෑකම නැති වන්නේ ය.

දුප්පතුන්ටත්, ඥාතීන් වන අසල් වැසියන්ටත්, ඥාතීන් නොවන අසල් වැසියන්ටත් යහපත සැලැස්විය යුතු බව අල්කුර්ආනය පවසයි. "අසල නිවසේ අය කුසගින්නෙන් පසු වන විට තමා පමණක් කුස පිරෙන්න ආහාර කන අය සැබෑ විශ්වාස වන්තයෝ නොවෙති." (තබරානි) යැයි නබි (සල්) තුමා අවධාරණය කර ඇත.

අවට පරිසරයේ අධික වශයෙන් ගෙවල් ඇති අවස්ථාවක අපට කිට්ටුවෙන් ම දොරකඩ ඇති නිවසට ප්‍රමුඛතාව ලබා දෙන්න ඕනෑ. ඉන් පසු අනෙක් නිවැසියා ඊළඟ නිවැසියා යැයි යා හැකි ය.

මෙසේ අසල් වැසියන්ට සලකමු. ඔවන්ගේ දුකෙහි හා සැපෙහි සහභාගි වෙමු. ඔවුන් සමඟ ඇති වන ප්‍රශ්න සාමකාමී ව විසඳා ගනිමු. ඔවුනට හැකි අයුරින් උදව් පදව් කරමු. ඔවුන්ගේ හොඳ හිත දිනා ගනිමු. එසේ ඉස්ලාම් කියන යහපත් අසල් වැසියෙක් වෙමු.

**අභ්‍යාස**

වරහන් තුළ දී ඇති වචනවලින් සුදුසු වචනය තෝරා හිස්තැන් පුරවන්න.

(කුසගින්නෙන් සිටිම, උරුමක්කාරයා, රෝගීවුවිට, උදව්වට, මුඃමින්, ජිබ්රිල් (අලයි), අසල්වැසියන්, හිතවත්කම, තුනකට, අසාධාරණකම්)

1. නිවසකට හතර දිශාවෙන්ම පදිංචි අය ............. ය.
2. අසල් වැසියන් ආකාර .................. වශයෙන් වර්ග කරයි.
3. අසල් වැසියනට ................... කිරීම බරපතල වරදකි.
4. අසල් වැසියන් දේපළ වලට ............. කරනු ඇතැයි නබි(සල්)තුමා බිය වූහ.
5. අසල් වැසියන් ............ සුවදුක් විමසිය යුතුයි.
6. අසල් වැසියන් හෙලා දැක කතා කළ හොත් ............. පලුදු වන්නේ ය.
7. අසල් වැසියන් ..................... සිටිය දී තමා පමණක් කුස පුරවා ගන්නා හොඳ මුඃමින් නොවේ.
8. අනතුරක දී පළමුව .................... ඉදිරිපත්වන්නේ අසල්වාසීන් ය.
9. අසල් වාසින් ගැන .................. තුමා නබිතුමාට නිතර උපදෙස් දුන්හ.
10. අසල් වැසියාට හිංසා කරන්නා .................. නොවේ.

**කෙටි උත්තර දෙන්න**

1. අසල් වැසියන්ට කළ යුතු යුතු කම් පහක් සඳහන් කරන්න.
2. අසල් වැසියන් පිළිබඳ සඳහන් වන හදීස් දෙකක් ලියන්න.